**ශීර්ෂය - 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1(අ) | 2021 වර්ෂයේ අපහරණය කරන ලද ලී බඩු උපකරණ, පරිගණක උපකරණ හා කාර්යාල උපකරණ අයිතම 70ට අදාළ පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ ශේෂයෙන් අඩුකර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 1.6.1 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

2021 සහ 2022 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මඟින් අපහරණය කරන ලද ලී බඩු උපකරණ, පරිගණක උපකරණ හා කාර්යාල උපකරණ අයිතම 155කට අදාළ පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ ශේෂයෙන් අඩුකර දැක්වීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මු.රෙ. 214 අනුව විධිමත් අයුරින් බැරකම් ලේඛනය පවත්වාගෙන යන ලෙස විෂය නිලධාරි දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය පවත්වා පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මු. රෙ. 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත ලේඛනයක් පවත්වා ගෙන යන මෙන් විෂය නිලධාරි දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 2ක් හා ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා සලසා තිබූ රු. 45,400,000ක් වූ ප්‍රතිපාදනයෙන් රු.34,353,585ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය සියයට 75ත් 100 ත් අතර පරාසයක් වී තිබුණි. | මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය නිකුත් කල චක්‍රලේඛ හා අමාත්‍යාංශය වරින් වර නිකුත් කල චක්‍රලේඛ ප්‍රකාරව වියදම් දැරීම සීමා කර තිබුණි. තවද අහදියා දීනියාත් විභාගය පැවැත්වීමේ අරමුණින් රු.මිලියන 49 ක් 1409-36 වැය විෂයයට මාරු කර අදාළ විභාගය පැවැත්වීම සඳහා සැලසුම් කළද අදාළ විභාගය, විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීම නිසා දෙසැම්බර් විභාගය වෙනුවෙන් 2024 වර්ෂයේ බිල්පත් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් කර නොතිබූ වැය විෂයය අංක 1405 සහ 1407 සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2024 වර්ෂයේදී පිළිවෙලින් රු.220,948 ක් සහ රු.253,518 ක් ගෙවීම් කර තිබුණි. | 2024 වර්ෂයේ පිරිසිදු කිරීම් හා ආරක්ෂක සේවා පිළිවෙලින් 1405 හා 1407 වැය විෂයය යටතේ වෙන්කර තිබුණු අතර 2024 CIGAS යෙදුම බාගත කිරීමෙන් පසුව ලද බිල්පත් අන්තර්ගත කිරීමේදී අදාළ වැය විෂයයෙහි අන්තර්ගත කර ඇති බව දන්වා තිබුණි. | බැරකම් සඳහා ප්‍රතිපාදන ඇති කර ගෙන තිබිය යුතු වේ. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 30 හා අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව නව CIGAS වෙබ් යෙදුම මඟින් ජනනය කරන ලද සමුච්චිත බැදීම් හා බැරකම් | 2023 වර්ෂය සඳහා ලද සියලුම බිල්පත් සඳහා ගෙවීම් 2023.12.31 වන විට ගෙවා නිම කර තිබූ අතර ජනවාරි මාසයේ ප්‍රමාද වී ලද බිල්පත් සඳහා ගෙවීම් CIGAS | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාව මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) වශයෙන් අමුණා නොතිබුණි. | මෘදුකාංග යෙදුමේ අන්තර්ගත කර තිබුණද තාක්ෂණික හේතුවක් නිසාවෙන් එය CIGAS වෙබ් පිටුවේ උඩුගතව නොමැත. එම නිසා CIGAS වෙබ් පිටුවෙන් බා ගත කර ඇතුළත් කළ යුතු ඇමුණුම iii අමුණා නොතිබිණි. නමුත් 2024 වර්ෂයේ CIGAS ආරම්භක බැරකම් ලැයිස්තුවේ අදාළ තොරතුරු ඇතුළත්ව ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් නොවන වැය විෂයය අංක 202-126-2-7-35-2401/12-P යටතේ රු.786,830 ක වටිනාකමින් යුත් බැරකමක්, 2023 දෙසැම්බර් 31 දිනට SA-92 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය තුළ ඇතුළත්ව තිබුණ ද, ඒ පිළිබඳව භාණ්ඩාගාරයට දැනුම් දී එම මුද්‍රිතය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එය භාණ්ඩාගාරයට දැනුම් දී ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් බැරකම් පමණක් මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කළ යුතු වේ. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති | ඉදිරියේදී සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර අදාළ සමාලෝචනයන් සිදුකිරීමටත් මේ සම්බන්ධයෙන් විගණකාධිපති ලිඛිතව දැනුවත් කිරීමටත් කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | එලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා එලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරික්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර අනුමත වූ දින සිට මෑතක් වනතුරුත් පුරප්පාඩුව පැවැති බැවින් අභ්‍යන්තර විගණන කාර්ය සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වී තිබූ නමුත් මේ වනවිට අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණකගේද සහය ඇතිව විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමටත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමටත් ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරික්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | i. මුදල් රෙගුලාසි 128 (1) (ඉ) | - | දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී | මුදල් රෙගුලාසි ප්‍රකාරව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හා 1647 (ආ) | | සත්‍යෝක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් සත්‍යෝක්ෂණයක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | කටයුතු කළ යුතු වේ. |
| | ii. මුදල් රෙගුලාසි 876 (3) | - | දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මඟින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර චක්‍රලේඛ ප්‍රකාරව අරමුදල පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය සලකා බලා නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හජ් අරමුදල නිත්‍යානුකූල පනතක් මගින් පිහිටුවාලිමට වන ක්‍රියාමාර්ග මේ වන විට අමාත්‍යංශය හා එක්ව සිදු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | දෙපාර්තමේන්තුව සතු වාහන 2ක් සම්බන්ධයෙන් 2019 වර්ෂයෙන් පසු ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර චක්‍රලේඛයෙහි ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කර නොතිබුණි. | මේ වන විට දෙපාර්තමේන්තුව සතු වාහනවලින් පසුගිය වසරේ අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවති වාහන දෙකක් හැර අනිකුත් වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කර අදාල වාහන අලුත්වැඩියා කටයුතු නිම කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 06 දෙනෙකුද ඇතුලුව නිකුත් කර තිබූ රු.550,796 ක අතුරු අග්‍රිම පියවීම සම්බන්ධ තොරතුරු අත්තිකාරම් ලේඛනයේ ඇතුළත්ව නොතිබුණු අතර ඒවා පියවූ බවට සනාථ කිරීම් ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල අග්‍රිම පියවීම් තොරතුරු යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | පිළිතුර සාවද්‍යා වේ. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණණ නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වකුෆ් අරමුදලට අදාළ 1982 අංක 33 දරන වකුෆ් පනතේ 45 වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ජාතිකයින්ගේ හා ඉස්ලාම් ආගමෙහි අභිවෘද්ධිය සඳහා ඉටු කළ යුතු කාර්යයන් 5න් එක් කාර්යයකට අදාළ එක් වැඩසටහනක් පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.161,500ක මුදලක් පමණක් වැය කර තිබුණු අතර අරමුදලේ වැටුප් හා දීමනා සඳහා වැය කළ මුදල රු.2,518,027ක් හෙවත් මුළු වියදමෙන් සියයට 93 ක් විය. අරමුදලේ අරමුණු නිසි අයුරින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල සතු මුදල් ප්‍රමාණය රු.79,538,421 ක් විය. | වකුෆ් පනත පරිදි මුස්ලිම් ජාතිකයන්ගේ හා ඉස්ලාම් ආගමේ අභිවෘධිය සඳහා ඉටුකල හැකි කාර්යන් 5, ඉටුකිරීම සඳහා වකුෆ් සභාවේ අවධානය යොමුකර අධ්‍යාපන වැනි ක්ෂේත්‍රවල අභිවෘධිය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන බවත් ඉදිරියේදී ඉතිරි අංශ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන බවත් දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | බැරකම් ලේඛනය සහ වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම, සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම, වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කර තිබීම, නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම, බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම සහ මූල්‍ය රෙගුලාසි 94(1) අනුව බැරකම්වලට එළඹීම වසර අවසානයේදී ඉතිරිව පැවති ප්‍රතිපාදන ඉක්මවා නොයාම යනාදී අනුකූල නොවන අවශ්‍යතා, අනුකූල වන බවට කාර්යසාධන වාර්තාවේ අනුකූලතා වාර්තාව තුළ දක්වා තිබුණි. | පෙන්වා දී ඇති යාවත්කාලින කර නොමැති පොත්පත් හා ලේඛන හඳුනාගෙන මුදල් රෙගුලාසි හා චක්‍රලේඛවලට අනුකූලව පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | අනුකූල වන අවශ්‍යතා අනුකූල වන ලෙසත්, අනුකූල නොවන අවශ්‍යතා අනුකූල නොවන ලෙසත් අනුකූලතා වාර්තාව තුළ ඇතුළත් කළ යුතු වේ. |
| (ආ) | කාර්යසාධන වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශක ඉදිරිපත් කර තිබුණද, එම කාර්යසාධන දර්ශක ගණනය කිරීම්වල නිරවද්‍යතාව පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | කාර්යසාධන දර්ශක ගණනය කිරීමට අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් ලැබී තිබුණු දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පර්චස් 80 ක් වූ ඉඩමෙහි 2017 වර්ෂයේදී දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල ඉදි කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු තීරණ වලට අනුව දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම ඇතිව අමාත්‍යාංශය මගින් මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු කරගෙන යනු ලබන බව දන්වා තිබුණි. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු වේ. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව හා 2019 නොවැම්බර් 28 දිනැති අංක 07/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම පරිදි ඇප තැබිය යුතු සියලුම නිලධාරීන්ගෙන් ඇප මුදල් අය කළ යුතු වේ. එසේ වුවද, නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී, සරප්, ගබඩා භාරකරු සහ රියැදුරු යන තනතුරුවලට අදාළ නිලධාරීන් 09 දෙනෙකුගෙන් ඇප මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ඇප ආඥා පනතට නව නිලධාරීන් හැර ඇප මුදල් අයකර ගත යුතු සියලුම නිලධාරීන්ගෙන් මේ වන විට ඇප මුදල් අයකර ගෙන ඇති අතර, රජයේ ඇප ආඥා පනත අනුව නවක නිලධාරීන්ගේද ඇප මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | පිළිතුර සාවද්‍ය වේ. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාපිත කරන ලද 2018 වර්ෂයේ සිටම අක්‍රීයව පවතින දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල සඳහා වූ මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දිනය වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු තීරණ වලට අනුව අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන්ද සමන්විත කමිටුවක් නම් කර ආර්ථික වශයෙන් වඩාත් ඵලදායි තීරණ ගත යුතු බව නිර්දේශ කර ඇති බැවින් ඉදිරියේදී පත් කරන කමිටුවේ නිර්දේශ අනුව ක්‍රියා කිරීමට බලාපොරොත්තු වන බව දන්වා තිබුණි. | කොන්ත්‍රාත්තු ගිවිසුමෙහි විධිවිධාන අනුව කොන්ත්‍රාත්කරුගෙන් අදාළ අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වසර 20කට වඩා පැරණි ණය ශේෂ එකතුව රු.70,504 ක් සහ වසර 01ත් වසර 20 ත් අතර කාලයක් හිඟහිටි මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.202,250 ක් හා විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.55,448 ක ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.52,800ක ශේෂය දෙපාර්තමේන්තුවේ සිට 2004 වර්ෂයේ ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරිනියකගේ වන අතර අදාළ ණය මුදල අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඉතිරි ණය මුදල වන රු.17,704 සම්බන්ධයෙන් අදාළ තොරතුරු නොමැති බැවින් ණය කපා හැරීමට කටයුතු කරමින් පවතී. විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු 529,708ක් වූ ණය මුදල අයකර ගැනීමට මැයි මාසයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර එය CIGAS හරහා ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(2) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයකු පත් කල යුතුය. එසේ වුවද, 2015 වර්ෂයේ ඇති කර තිබූ අභ්‍යන්තර විගණක තනතුර මෙම වාර්තාවේ දිනය වන විටත් පුරප්පාඩු වී පැවති අතර අදාළ තනතුරේ වැඩබැලීම සඳහා 2023 නොවැම්බර් මාසයේ නිලධාරියෙකු පත් කර තිබුණ ද අභ්‍යන්තර විගණන කාර්යයන් කිසිවක් සිදු කර නොතිබුණි. | මේ වනවිට අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේද සහය ඇතිව විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමටත් හා නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමටත් ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තියේ විධිවිධාන පරිදි සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර අනුමත වූ දින සිට මෑතක් වනතුරුත් පුරප්පාඩුව පැවති බැවින් අභ්‍යන්තර විගණන කාර්ය, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වී තිබූ නමුත් මේ වනවිට අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේද සහය ඇතිව විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට හා නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථානමාරු ලබාදිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 05ක් ඉක්ම වූ නිලධාරීන් 39 දෙනෙකු සඳහා ස්ථානමාරු ලබා දීමට කටයුතු කර නොතිබුණි. ඒ අතුරින් නිලධාරීන් 08 දෙනෙකු වසර 18 ක සිට 24 ක් දක්වා කාලයක් දෙපාර්තමේන්තුව තුළ සේවය කර තිබුණි. | දෙපාර්තමේන්තුව ප්‍රියමනාප ස්ථානයක් නොවන බැවින් හා වෙනත් නිලධාරියෙකු ස්ථානමාරු සඳහා මෙම දෙපාර්තමේන්තුවට අයදුම් නොකරන බැවින් අනුප්‍රාප්තිකයකු ලබාදීමට ඇති ගැටළුව මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ස්ථානමාරු සිදු නොකෙරුවද වසර 05ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය සෑම වසරකම වාර්ෂික ස්ථානමාරු ලේඛනයට ඇතුළත් කර ඇති බව දන්වා තිබුණි. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වී දිගු කාලයක සිට ආයතනයේ සිටින නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කල යුතුය. |